පොල් වගා වනසන රතු කුරුමිණි හොයන ගහේ කඳට සවි කරන විස්මිත උපකරණයක්

සෙන්සරයක් කඳට හයි කරනවා

කුරුමිණි සද්දෙ වෙනම හොයනවා

ඇප් එකක් හරහා සියලු තොරතුරු ගන්නවා

ලෙඩ ගස් G.P.S. සිතියම්ගත වෙනවා

ඔහු අපූරු විද්‍යාඥයෙක් නොවැ. හසිත බණ්ඩාර වේගිරිය. කොට්ටාව ධර්මපාල මහා විද්‍යාලයේ ආදි සිසුවෙක්. දියුණු ශිෂ්ටාචාරයේ අග නගරය වූ ලන්ඩනය කරා ඔහු නොගියා නම් නිච්චියටම මේ හතරවියන් පුරුෂයා කුමන වෘත්තියක් තෝරා ගනීවිද. ඔහුටම උචිත වෘත්තීය හිමිව ඇති හැඩයි. හසිත බණ්ඩාර වේගිරිය කුඩා කල සිටම තමුන් ඉදිරිපිටට පැමිණෙන කුමන හෝ ගැටලුවක් ඉදිරියේදී සිදුකර ඇත්තේ එකී ගැටලුව පසෙකලා නව නිපැයුමක් නිමැවීමට සිත මෙහෙයවීම. ඒ නිසයි ඔහු 1999දී තමන් නිර්මාණය කළ මිදුල අතුගාන පුංචි මැෂිම 2001 වර්ෂයේදී තවත් දියුණු කර නව නිපැයුම් කොමිසම වෙත ඉදිරිපත් කරනු ලබන්නේ. එහිදී ඔහු ජයග්‍රාහකයකු වන අතර ඉන් පසුව එම නිමැවුම අන්තර්ජාතික ජයග්‍රහණ කීපයක්ද ලබාගනී. හසිත බණ්ඩාර වේගිරියගේ මව ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කළ චිත්‍රානි අබේරත්න බණ්ඩාරය. පියා ගුවන් හමුදාවේ විශ්‍රාමික නිලධාරියකු වන අබේරත්න බණ්ඩාරය. ඔවුනොවුන් කෙදිනකවත් නොසිතන්නට ඇති තම පුතා මෙවන් හපන්කමක් සිදුකරතැයි කියා. එය නොවේ වැඩේ. මිදුල අමදින මැෂිම නව නිපැයුමක් ලෙස ඉදිරිපත් කළ හසිත බණ්ඩාර වේගිරිය ඉන්පසු පැමිණෙන්නේ කොතැනටද?. ඒ සඳහා ඔහුට බලපෑම් කරන ලද්දේ කුමන කරුණු කාරණාද.

ගෝලීය ආර්ථික අවපාතය හේතුවෙන් අන්ද මන්ද වී කොතැනක ආයෝජනය කරනවාදැයි සිතන ධනවතුන්ගේ ප්‍රමුඛතම කාර්යය වී ඇත්තේ පොල් වගාවය. ලෝකයේ ඉතා හොඳම ආයෝජන මාර්ගෝපදේශකත්වයන් පවසන්නේද පොල් වගාව කරා යොමුවිය යුතු බවය. ආයෝජන අවස්ථා පිළිබඳ විමසිල්ලෙන් සිටින දැවැන්ත ප්‍රාග්ධන හිමිකරුවන් මේ වන විට තැරැව්කරුවන් හරහා ඉඩම් මිලදීගෙන එම ඉඩම්වල බොහෝ වශයෙන් වගා කරනු ලබන්නේ තාල වර්ගයේ ශාකයන්ය. පොල් සහ කටුපොල් එහිදී විශේෂ වේ. කෘෂි ඉඩම් සඳහා වන ඉල්ලුම ඉහළ යෑම මෙම තත්ත්වය මත ඇති වූ ප්‍රතිඵලයකි. වගා නොකළ ඉඩකඩම් විශාල වශයෙන් ඇති අප්‍රිකානු මහද්වීපය වෙත දැන් ගෝලීය ධන ආයෝජකයන්ගේ ඇල්ම බැල්ම වැටී පවතියි. ඊට හොඳම උදාහරණය වන්නේ 2009 වර්ෂය අවසාන වන විට චීනය අප්‍රිකාව තුළ ඇති තම කෘෂි වත්කම් තවත් වර්ධනය කරනු පිණිස ඇමරිකන් ඩොලර් බිලියන 5ක් වෙන්කිරීමය. එහිදී අප ගත යුත්තේ ලෝක ජනගහනයෙන් 20%ක් වසන චීනය තුළ ලොව ඇති සමස්ත වගා බිම් ප්‍රමාණයෙන් හිමිව ඇත්තේ 7%ක් පමණ වන බවය. තෙල් සල්ලි මතින් බල අධිකාරියක් සදාගෙන ඇති කටාර් රාජ්‍ය, අබුඩාබි සහ සෞදි අරාබියද අප්‍රිකාවේ මුඩු ඉඩම් බද්දට ගෙන තාල වර්ගයේ ගස් වගා කිරීමට මෙතරම් උනන්දුවක් දක්වන්නේ මෙම තත්ත්වය මතය. තාල වර්ගයේ ගස් සඳහා විශේෂයෙන් පොල් ගස් සඳහා මේ වන විට ප්‍රධාන සතුරා බවට පත්ව ඇත්තේ කුරුමිණි වර්ග 2කි. ඉන් ප්‍රධාන වන්නේ පොල්ගසේ කඳට හානි සිදුකරනු ලබන රතු කුරුමිණි විශේෂය. පොල්ගසේ කඳට හානි කරන රතු කුරුමිණියා පිළිබඳව ගොවීන් දැනුවත් වන්නේ පොල්ගසට සිදුව ඇති හානිය පූර්ණය කළ නොහැකි අවස්ථාවක වීම සුවිශේෂිය. නමුත් ලාංකික විද්‍යාඥයෙක් වන හසිත බණ්ඩාර වේගිරිය විසින් නිපදවූ නව විද්‍යාත්මක උපකරණයක් මඟින් රතු කුරුමිණින් පොල්ගසේ කඳට යම් හානියක් සිදුකර ඇද්ද යන්න පළමු සති දෙකේදී දැනගත හැකිය. අප ලාංකික විද්‍යාඥ හසිත බණ්ඩාර වේගිරියට සවන්දෙමු.

"ජාතික පොල් පර්යේෂණ ආයතනයේ ආචාර්ය ප්‍රියන්ත ප්‍රනාන්දු, ආචාර්ය ත්‍රිෂාන්ත නානායක්කාර මට යෝජනා කළා රතු කුරුමිණි විශේෂය පොල් වගාවට සිදුකරන හානිය පිළිබඳ පර්යේෂණ සිදුකරලා ඒ හානිය අවම කර ගැනීමට හැකි මෙවලමක් හෝ ක්‍රමවේදයක් හඳුන්වාදෙන්න කියලා. ඒ වෙද්දී ආචාර්ය ත්‍රිෂාන්ත නානායක්කාර මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කළා. ඒ එක්කම එතුමා නව නිපැයුම් අධිකාරියේ කොමසාරිස්වරයා. ඒ වෙද්දී මේ රතු කුරුමිණි විශේෂය යම් ගසකට හානි කරනවාද කියලා හඳුනා ගන්න තිබුණේ ශ්‍රවණය මුල්කරගත් උපකරණයක් පමණයි. ඒ උපකරණය භාවිත කිරීම සඳහා යම් පුහුණුවක් තිබිය යුතු වුණා. මොකද ඒ ශබ්ද නැවත නැවත ඇසිය යුතු නිසා. මම දැනට ආචාර්ය උපාධිය සඳහා සූදානම් වන්නේ ලන්ඩන් සරසවියක. මගේ ආචාර්ය උපාධියේ නිරීක්ෂකයා ලෙස කටයුතු කරන්නේ ආචාර්ය ත්‍රිෂාන්ත නානායක්කාර. ආචාර්ය උපාධිය සඳහා මගේ රිසර්ච් එක වුණේ බල්ලන්ගේ පූසන්ගේ මුහුණේ තිබෙන දෙපැත්තට විහිදෙන රැවුල වැනි කෙඳි ඒ සතුන්ගේ ජීවිතය පවත්වාගෙන යන්න දිරි දෙන්නේ එසේත් නොමැතිනම් ප්‍රයෝජන වන්නේ කොහොමද කියන එක. සාමාන්‍ය පූසෝ මීයෝ වගේ සත්තු තමන්ගේ මුළු ජීවිතයම යාවත්කාලීන කර ගන්නේ ඒ සියුම් රැවුල වැනි කොටස් නිසා. ඒවා ඒ අයගේ සෙන්සර්. මිනිස්සු විදියට අපි අතපත ගාලා දෙයක් භෞතිකව අත්විඳලා ලබා ගන්න දැනුම සත්තු ලබා ගන්නේ ඒ අයගේ අර කුඩා රැවුල වැනි කොටසින්. එයාලගේ පොලිකල් එක ඒක. එතැන තියෙනවා නැවෝඩයින්සන් 2ක්. ඒ මැද තියෙනවා ඩෝනට් එක වගේ මසල් එකක්. මේවා ඔක්කොම වගේ මිලිමීටරයකින් අඩක පිහිටි අංගෝපාංග. මේ පුංචි ඉඩේ තමයි ඒ සත්තුන්ගේ ජීවිත ඉරණම තීන්දු කරන්නේ. මම ඒ පිළිබඳ දිගින් දිගට පරීක්ෂණ සිදුකළා. එහි අරමුණ වුණේ ඉදිරියේදී නිපදවන රොබෝ යන්ත්‍රවලට ඒ දැනුම කාන්දු කරන්නේ කොහොමද කියන එක ගැන සොයා බැලීම. ගොඩක් සෙන්සිටිව් මට්ටමේ සෙන්සර් නිපදවන්නේ කොහොමද කියන එක මම ඉගෙනගන්න උත්සාහ ගත්තේ ඒ සත්තුන්ගෙන්.

ඔය ෆීඩ්බැක් කොන්ට්‍රෝල් මැකනිසම් යොදාගත්තම සෙන්සර් එක ඇතුළෙදීම ෆිල්ටර් වෙනවා. එතැනදී කම්පිඩේෂන් වීචි එක අවමයෙන් පාවිච්චි කරන්න පුළුවන්. හැකි ඉක්මනින් පිළිතුරු ලබාගත හැකියි. උදාහරණයක් විදියට අපේ අතට බරක් දීලා ඒ බර කොපමණද කියලා අපෙන් ඇහුවොත් අපි ඒ බව උස්සල බලලා ආසන්නව වැටයීමක් සිදුකරනවා. උස්සල බලන එකේදී කරන්නේ අපේ මාංසවල තියෙන සෙන්සර් ආසන්න දත්ත ලබාදීමක්. එතනදී සියුම් වෙනසක් පවා ඉක්මනින් හඳුනාගන්න පුළුවන්. රතු කුරුමිණින් ගැන මම සොයාබැලීම් කරද්දී යොදාගත්තේ මා සතුව ඇති ඒ බයෝ ලොජිකල් දැනුම. ඒත් ඇතුලේ සෙන්සර් එකක් බොහොම ඉක්මනට කොහොමද ෆිල්ට කරන්නේ කියන එක. ඒ දැනුම තමයි රතු කුරුමිණි විශේෂ ගසක කඳක් තුළ සිටිනවා යන්න නිවැරදිව දැන ගැනීමට යොදාගත්තේ. ඊට පසු මම මේ උපකරණය සම්පූර්ණයෙන්ම අලුත් සෙන්සර් එකක් විදියට හැදුවා. ගිය අවුරුද්දේ ලන්ඩන්වල ඉඳලා ලංකාවට පැමිණි අවස්ථාවේදී නැවත පාරක් අත්හදා බැලුවා. මේ සෙන්සර් එකට අදාළ ඇප් එක නිර්මාණය කළා. ආචාර්ය නිශාන්ත කුමාරත් එක්ක එකතු වෙලා ඇප් එක සහ සෙන්සර් නිමැවුම නැවත නැවත පරීක්ෂා කළා. එතුමා දැන් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙක්. ආචාර්ය ප්‍රියන්ත ප්‍රනාන්දු මට එතැනදී උදවු කළා. ඒ අවුරුද්දේදී මම මගේ උපකරණය ෆයිනල් ප්‍රඩක්ට් එකක් විදියට එළිදැක්වූවා. මේ උපකරණය රතු කුරුමිණි හානිය පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීම මූලික අවස්ථාවේදීම සිදුකරනවා. ඕනෑම නුපුහුණු සේවකයකුට වුණත් මේ උපකරණය භාවිත කරන්න පුළුවන්. එහි අග තිබෙන සෙන්සර් මඟින් ලබාගන්නා රතු කුරුමිණීන්ගේ ශබ්ද ජංගම දුරකතනය මඟින් අපේ සර්වර් එකට ලබාදිය හැකියි. ගස පිහිටි ස්ථානය පිළිබඳ ලොකේෂන් ගත්තම කුරුමිණි උවදුර පැතිර යා හැක්කේ කොයි ආකාරයෙන්ද කියන එකත් දැනගන්න පුළුවන්. එතැනින් පසුව වගාව තුළ මෙම උවදුරට අන්තර්ජාතික මට්ටමට රැගෙන යන දැනුමක් ගොවීන්ට හිමි වෙනවා. අනාගතය පවා ඉලක්ක කරගෙන දේශගුණ කාලගුණ බලපෑම්, ඉන් පරිබාහිර වෙනත් බලපෑම් නිසා රතු කුරුමිණි විශේෂ උවදුර පැතිර යනවාද වගේ මූලික සිද්ධාන්ත කරාත් මෙම නිමැවුම මඟින් අපට යා හැකි මාර්ග එළිපෙහෙළි වෙනවා. තවදුරටත් කිව්වොත් මෙලෙස රතු කුරුමිණි විශේෂ පැතිර යන්නේ වෙනත් බෝග වර්ගයක බලපෑමක් නිසාද කියාත් ඒ පිළිබඳවත් සොයාබැලිය හැකියි. අන්තර්ජාතිකව මෙම දත්ත ලබාගෙන පසුව ඒවා එක එක රටවලට ලඝු කර කරුණු අධ්‍යයනය කළ හැකියි. මොනකොඩෆස් කියන රසායනය යොදාගෙන රතු කුරුමිණි උවදුර මැඩලන්න රජය තීරණය කරනවා නම් එය නිවැරදිව තහවුරු කරගන්න එම උපකරණය නිසා හැකි වෙනවා. තේ හැන්දක බාගෙකටත් වඩා අඩු ප්‍රමාණයකින් එම රසායනික ද්‍රව්‍ය යොදාගත්තොත් පුද්ගල මරණයක් පවා ඇති කළ හැකියි. මෙම උපකරණ එවැනි රසායනික ද්‍රව්‍යයක් භාවිත කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ පහදාදීම සිදුකරනවා. මෙම උපකරණය මත ඇති සෙන්සර් තවදුරටත් දියුණු කරලා ගස පිළිබඳ සියලු දත්ත, පරිසරයේ ආර්ද්‍රතාව පිළිබඳ දත්ත ලබාගැනීමට පවා මම ඉදිරියේදී ක්‍රියා කරනවා. ස්මාට් ෆාම් කියන ක්‍රමවේදයට අපේ පොල් ගොවීන් හැකි ඉක්මනින් රැගෙන යා යුතුයි. මෙම උපකරණය එහි පළමු පියවර ලෙසයි මම දකින්නේ. මෙම දත්ත සමාජ මාධ්‍ය ජාලාවක් බවට පත්කරලා ගොවීන් අතරේ ඔවුනොවුන්ගේ දැනුම හුවමාරු කරගත හැකි මට්ටමකට රැගෙන ඒමයි මගේ බලාපොරොත්තුව.

■ කතාව පින්තූර
ප්‍රභාත් අත්තනායක

රතු කුරුමිණි විශේෂය පොල් වගාවේදී හානි කරන්නේ පොල් ගසේ කඳ කොටසට. පොල් කඳේ ඇති කුඩා සිදුරක් මඟින් ගස තුළට ඇතුළු වෙලා සතා තමන්ගේ ප්‍රජනන කාර්යය ඉටුකරනවා. ඒ මඟින් බිහිවන කීටයන් පෝෂණය වන්නේ පොල් ගසේ තන්තු කොටස් සිය පෝෂණ පදාර්ථ ලෙස ලබාගෙන. ඒ තන්තු කොටස් සමඟ තමයි ගස මහ පොළොව සමඟ සිය සම්බන්ධය ගොඩනඟා ගන්නේ. රතු කුරුමිණි විශේෂය නිසා එම සම්බන්ධය කඩා වැටෙනවා. පොළොවෙන් උරා ගන්නා පෝෂණ කොටස් ගසට අහිමි වෙනවා. ගස අභ්‍යන්තරයේ සිට රතු කුරුමිණියන් සිය පෝෂණය සකසා ගන්නවා. ඊට පසුව කෙටි කාලයකින් රතුපාට ශ්‍රාවයක් ගසේ කඳෙන් වෑස්සෙන්න ගන්නවා. ඒ වනවිට ගසට නැවත පූර්ණය කළ නොහැකි හානියක් සිදුවෙලා. එවිට ගොවියන් සිදුකරන්නේ ගස කඳින් කපා දමා කුරුමිණියා පැතිර යෑම වැළැක්වීමට කඳ කොටස පුළුස්සා දැමීම. කුරුමිණියාගේ පැතිර යෑම එයින් පාලනය වෙනවා කියා ගොවීන් සිතනවා. නමුත් යම් ගසකට මෙම රතුකුරුමිණි ආක්‍රමණය සිදුව ඇත්නම් පළමු සතිය හෝ දෙවැනි සතිය තුළ දැන ගැනීමට හැකිවුණොත් පමණයි කුරුමිණි උවදුරින් ගස බේරාගත හැකිවන්නේ. ඒ කඳට ලබාදෙන එන්නතක් මඟින්. ඒ එන්නත මඟින් ලබාදෙන්නේ මොනකොඩෆස් කියන රසායනය. ඒ රසායනය අතිශයින් විස සහිතයි. යුරෝපා රටවල් ගණනාවක් ඒ රසායනික ද්‍රව්‍ය තමන්ගේ රටවල් තුළ භාවිත කිරීම තහනම් කරලයි තියෙන්නේ. ලංකාව තුළ වුණත් මම දන්නා හැටියට එය තහනම් රසායනික ද්‍රව්‍යයක්. නමුත් කෘෂිකාර්මික රටක් විදියට පොල් වගාව පිළිබඳ ඇති උනන්දුව නිසා යම් ගොවීන් පිරිසක් තමන්ගේ වගාවට රතු කුරුමිණි උවදුරින් හානි සිදුවෙනවා කියලා නිශ්චිතව පෙන්වා දුන්නොත් ජාතික පොල් පර්යේෂණ ආයතනය මැදිහත් වෙලා එම රසායනික ද්‍රව්‍ය ගොවීන්ට ලබාදෙනවා. ඒක ප්‍රායෝගිකව ගැටලුකාරියි. පොල් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් පැමිණ ක්ෂේත්‍ර පරීක්ෂණයක් රසායනික ද්‍රව්‍ය ලබාදීමට පෙර සිදුකළ යුතුයි. එවැනි විටෙකදී ඇතිවිය හැකි ප්‍රායෝගික ගැටලු බොහෝමයි. මේ තත්ත්වය ලංකාවට පමණක් මූලික වූ ගැටලුවක් නොවෙයි. තාල වර්ගයේ ගස් වැවෙන ඒවායින් ප්‍රයෝජනය ගන්නා ලෝකයේ රටවල් 60ක ඇති තාල වර්ගයේ ගස් 40ක් පමණ රතු කුරුමිණියාගෙන් පීඩා විඳිනවා. පොල්, කටුපොල් (පාම් ඔයිල් ලබාගන්නා) ඒ සඳහා උදාහරණ. මෙම රටවල පලදාවෙන් 10%ක් මෙම රතු කුරුමිණි උවදුර නිසා වාර්ෂිකව විනාශ වෙනවා. දැන් ලංකාව ලෝකයට සාපේක්ෂව ගත්තොත් 4%ක පමණ පොල් නිෂ්පාදනයක් සිදුකරන රටක්. ඒ ප්‍රමාණය මුදලින් ගත්තොත් ඩොලර් මිලියන 1.7ක්. ඒ කියන්නේ රුපියල් මිලියන 300ක මූල්‍යමය පාඩුවක් වසරක් තුළ රතු කුරුමිණියන් නිසා සිදුවෙනවයි කියන එක. එහෙම හානියක් පැමිණි පසු ගොවීන් කරන්නේ විකල්ප ගොවිතැන් කරා යොමුවීම. එසේත් නොමැතිනම් පොල් ගොවිතැන අත්හැර දැමීම. 1970 වර්ෂයේ සිට රතු කුරුමිණියන් මර්දනය කිරීමට නොයෙකුත් පර්යේෂණ සිදුවුණා. නමුත් ඒවා සාර්ථක වුණේ නෑ. අපිත් අවුරුදු 12ක කාලයක සිට විවිධ පැතිකඩ ඔස්සේ මෙම රතු කුරුමිණි උවදුර මර්දනය කරන්න පර්යේෂණ කරනවා. අවසානයේදී තමයි මේ සඳහා මූලික ප්‍රතිකාර මාදිලියක් සොයාගත්තේ. ඒක තමයි අප දන්නා තරමින් රතු කුරුමිණියන් පිළිබඳව ලෝකයේ සිදුකළ හොඳම සොයාගැනීම. මොකද ඕනෑම විද්‍යාත්මක නිමැවුමක් ගොවීන්ට සමීප විය යුතුයි. ගසක කඳක් තුළ රතු කුරුමිණියන් සිටිනවාද යන්න දැනගැනීම සඳහා අප නිපදවූ උපකරණයෙන් හැකියි. කුඩා උලක් වැනි සෙන්සර් උපකරණයක් ගසේ කඳට සම්බන්ධ කර ඒ සෙන්සරය ආධාරයෙන් අපට හැකියි කුරුමිණියන් ගසේ කඳ තුළ සිටිනවාද යන්න නිරවුල්ව තේරුම් ගැනීමට. පළමු සතිය, දෙවැනි සතිය තුළදී මෙය සිදුකළ හැකිවීම එසේත් නොමැතිනම් ගසේ කඳ තුළ රතු කුරුමිණියන් සිටිනවාද යන්න දැනගත හැකිවීම විශේෂයි. අපේ පළපුරුදු ගොවීන් සිටිනවා ගසේ කඳට කන තියල කඳ තුළ කුරුමිණියන් සිටිනවාදැයි පැහැදිලි කරන. නමුත් පරිණත ගොවියකුට වුණත් ගසක කඳක සිටින කුරුමිණියන් හඳුනාගත හැකි වන්නේ කුරුමිණියන් ගස ආක්‍රමණය කර මාස 2කට හෝ 3කට පසු. මොකද ගසේ ඉහළට ජලය රැගෙන යන විට ඇතිවන ශබ්දය සහ රතු කුරුමිණියන්ගේ විශේෂ ශබ්දය බෙහෙවින් සමානයි. ඒ විතරක් නොවෙයි ගස සුළඟට ඇඹරෙන විට ඒ ගසේ තන්තු එකිනෙක ගැටෙන ශබ්දය පවා කුරුමිණි ශබ්දයට සමානයි. සමහර විට මේ රතු කුරුමිණියා ශබ්දය අනුව පරිණාමය වෙන්න ඇති. ඒ නිසයි කුරුමිණියාගේ ශබ්දය මිනිස් ශ්‍රවණ ඉන්ද්‍රියන්ට හුරුවෙලා තියෙන්නේ. අපේ නව නිපැයුම මඟින් මූලිකව රතු කුරුමිණි ආසාදනය හඳුනාගෙන ඉන් මත්තට ලබාදෙන ප්‍රතිකාර රටාව ගොවීන්ටම බාර කරනවා.

ආචාර්ය ත්‍රිෂාන්ත නානායක්කාර

ශ්‍රවණ ආශ්‍රිත මොළයේ ක්‍රියාකාරීත්වය ඉක්මවා ගිය උපකරණයක් ලෙස මෙම උපකරණය හඳුන්වාදිය හැකියි. ජංගම දුරකථනය (සෙන්සර්) ඒ සඳහා අප නිපැයූ මෘදුකාංගය (ඇප්එක) සහ ශ්‍රවණ ආශ්‍රිත මොළයේ ක්‍රියාකාරීත්වය කියන තුන්කොටස මඟින් තමයි අපි මේ රතු කුරුමිණි උවදුර හඳුනා ගන්නේ. මෙතැනදී ගොවියාට තියෙන ඉපැරණි දැනුම විශේෂයෙන් ශ්‍රවණ ඉන්ද්‍රියක් ලෙස කන දියුණුවීම කියන එක සමඟ නවීන තාක්ෂණය එක්කාසු කිරීමක් තමයි අපි මෙම උපකරණය මඟින් සිදුකරන්නේ. ගොවීන් කැමැති නැහැ තමන්ගේ අත්දැකීම් වෙන යම් උපකරණයක් මඟින් පිළිගන්න. ඔවුන්ගේ දැනුමට බද්ධව ලැබෙන පිළිතුරු පමණයි ඔවුන් පිළිගන්නේ. ඔවුන් වගවන්නේ ඔවුන්ගේ පාරම්පරික දැනුමට. අපි මේ නව නිපැයුම මඟින් මේ සියල්ල එක්කාසු කළා. නමුත් ගොවීන් කොච්චර පැවැසුවත් ජාතික පොල් පර්යේෂණ ආයතනය ගස්වලට සිදුව ඇති හානිය පිළිබඳ මූලික නිර්ණයකට පැමිණිය යුතුයි. ශබ්දය මත සහ සිය අත්දැකීම් මත යම් ගොවියෙක් පැවැසිය හැකියි මේ ගස රතු කුරුමිණි උවදුරට ලක්වෙලා කියලා. අප හදපු ජාලය මත ගොවීන් ක්‍රියාත්මක වුණොත් ඒ තොරතුරු අපේ සර්වර් එක හරහා ලබාදුන්නොත් එය සිතියම් ගත වෙනවා. අපේ මොබයිල් ඇප් එක හරහා හානියට පත්වුණා කියලා ගොවියා පෙන්නලා දෙන ගසේ ජී.පී.එස්. කණ්ඩාංකය ලකුණු වෙනවා. ඒ අනුව අපට පහසුවෙන් ඒවා නැවත සිතියම් ගත කළ හැකියි. එපමණක් නොවෙයි අපේ උපකරණය මඟින් ලබාදෙන ගසේ කඳේ සවුන්ඩ් රැක්එක පවා අප ඒ සිතියමට ඇතුළත් කරනවා. එවිට පොල් පර්යේෂණ ආයතනයට පහසුවෙන් හැකියි ප්‍රතිකාර ලබාදිය යුතු ගස් හඳුනා ගන්න. අප ලබාදෙන තොරතුරු සෘජුව ජාතික පොල් පර්යේෂණ ආයතනයට ලැබෙනවා. එතැනදී අපි ගොවීන් වෙනුවෙන් මිලක් පොල් පර්යේෂණ ආයතනයට ගෙවනවා. පොල් පර්යේෂණ ආයතනය පිළිගත්තොත් ප්‍රතිකාර ලබාදිය යුතු ගස් තිබෙනවා කියා ගොවියන්ගේ ගැටලුවලට කඩිනමින් විසඳුම් ලැබෙනවා. මෙය ජාතික සැලැස්මක් මත ක්‍රියාත්මක විය යුතුයි. මේ සඳහා විශාල මූල්‍ය පිරිවැයක් දැරිය යුතුයි. අපේ පර්යේෂණ කාලය අවුරුදු 12ක්. ඒ නිසා විශාල මූල්‍යමය පිරිවැයක් දරන්න අපට බැහැ. ලංකාවේ අක්කර දෙකක පොල් ඉඩමක් හිමි ගොවියකුට අවුරුදු 2ක් ඇතුළත රුපියල් ලක්ෂ 4ක පාඩුවක් මෙම රතු කුරුමිණි උවදුර නිසා සිදුවෙනවා. ඉන් 20%කට තමයි අපි සහන ලබාදෙන්නේ. නිවැරදිව ක්‍රියාත්මක වුණොත් ඉතිරි 80%ක ලාභය හිමිවන්නේ ගොවීන්ට. එය ගොවීන් තේරුම්ගත යුතුයි. ගොවීන්ගේ පැත්තෙන් ගත්තොත් මෙම නව උපකරණය දීර්ඝකාලීන ආයෝජනයක්. පොල් වගාකරුවන් සමඟ අප සාකච්ඡා කළා. ඒ අය දීර්ඝ කාලීනව අප සමඟ සම්බන්ධ වෙලා වැඩකරන්න කැමැතියි. ගොවියා ලබාදෙන තොරතුරු ඉදිරියේදී අපේ සර්වර් එක හරහා එය මේතාක් දුරට අප රතු කුරුමිණි උවදුර පිළිබඳ සකසා ගත් කෘතිම බුද්ධිය සමඟ ගළපාගෙන ගොවීන් ලබාදෙන තොරතුරුවල නිරවද්‍යතාව සහතික කළ හැකි වැඩපිළිවෙළක් අප ඉදිරියේදී ගොඩනගනවා. එහිදී අප කෘත්‍රිම බුද්ධිය පෙර සඳහන් කළ ලෙස ගොඩනඟන්නේ ගොවීන් ලබාදුන් දීර්ඝ කාලීන දත්ත නියැදින් මත. මෙය ගොවීන් සහ අප (නවීන තාක්ෂණය) අතර සම සබැඳියාවක් ගොඩනැගීමක් ලෙසත් පෙන්වාදිය හැකියි.

■ ප්‍රභාත් අත්තනායක